# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 11 ශ්‍රේණිය

The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

වාරය - III

ඒකකය - (24) අත්දැකීම් ප්‍රතිනිර්මාණය

අවබෝධය 01

**01. පාඩම හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. අත්දැකීම් ප්‍රතිනිර්මාණය පාඩම සකස් කිරීමට උපයෝගී කොට ගත් ග්‍රන්ථ දෙක දක්වන්න.
   i. ..........................................................................................................
   ii. ..........................................................................................................
2. ඒවායේ කතුවරුන් වෙන වෙනම ලියන්න.
   i. ..........................................................................................................
   ii. ..........................................................................................................
3. ''වහල්ලු'' කෙටිකතාව කාගේ නිර්මාණයක් ද?
   ..........................................................................................................
4. වහල්ලු කෙටිකතාව ලිවීමට පාදක වූ චරිතය දක්වන්න.
   ..........................................................................................................
5. ''වෙසක් පහන'' හා ''ගමන'' යන කෙටිකතා නිර්මාණය කළේ කවරෙක් ද?
   ..........................................................................................................
6. ''මාර යුද්ධය'' හා ''බුද්ධත්වය'' කවි පන්ති නිර්මාණය කළේ කවරෙක් ද?
   ..........................................................................................................
7. මහගම සේකර සූරීන් අතින් රචිත කාව්‍ය සංග්‍රහයන් දෙකක නම් ලියන්න.
   i. ..........................................................................................................
   ii. ..........................................................................................................

**ක්‍රියාකාරකම**

**02.** **පාඩම ඇසුරෙන් පහත ප්‍රශ්න සඳහා ඉදිරිපත් කර ඇති පිළිතුරු හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න.**

**1. නිර්මාණකරුවෙකු තම නිර්මාණය සඳහා පාදක කර ගන්නේ**

i. තමා විසින් විඳින ලද දෑ විය හැකි ය. ☐
ii. තමා විසින් අත් ලද දෑ විය හැකි ය. ☐
iii. මනසින් ග්‍රහණය කර ගන්නා ලද දෑ විය හැකි ය. ☐
iv. යම් සිද්ධියකට හෝ අවස්ථාවකට සම්බන්ධ වීමෙන් ඒ පිළිබඳ ලබන අවබෝධය විය හැකි ය. ☐
v. යම් සිද්ධියක් හෝ අවස්ථාවක් නිරීක්ෂණය කිරීමෙන් ලබන අවබෝධය විය හැකි ය. ☐
vi. යම් හැඟීම් සමුදායක් විය හැකි ය. ☐

**2. උසස් සාර්ථක කලාකරුවා/නිර්මාණකරුවා**

i. තමා අත්විඳින ලද දෙය ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කරයි. ☐
ii. තමා අත්විඳින ලද දෙය ඒ ආකාරයෙන් ම ඉදිරිපත් නො කරයි. ☐
iii. වින්දනාත්මක අර්ථයක් දනවෙන ලෙස අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරයි. ☐
iv. අත්දැකීමෙන් තමා ලැබූ වින්දනය අන්‍යනට ලබා නො දෙයි. ☐

**3. සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි වන්නේ**

i. අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීම නිසා පමණක් ය. ☐
ii. තෝරාගත් අත්දැකීම් පාඨකයාට වින්දනය ඇති වන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය. ☐
iii. තමා අත්දුටු දෙය ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කිරීම නිසා ය. ☐

**4. හොඳ කලාකරුවාගේ කාර්ය වන්නේ**

i. සත්‍යය ඉදිරිපත් කිරීම ය. ☐
ii. තමා ලැබූ වින්දනය අන්‍යන්ට ද ලබා දීමට සත්‍යයේ මායාව බැහැර කිරීම ය. ☐
iii. තමා අත්විඳි හැඟීම් හා සමාන මානසික තත්ත්වයක් ඒ නිර්මාණය ආස්වාදනය කරන්නාගේ මනසෙහි ද ජනිත කිරීම ය. ☐

**5. නිර්මාණයකට පාදක වන අත්දැකීමක්**

i. අපූර්ව හෙවත් මින් පෙර නුවූ විරුවක් විය යුතු ය. ☐
ii. එහි අර්ථාන්විතභාවයක් නො විය යුතු ය. ☐
iii. එය විශ්වසනීයත්වයෙන් යුක්ත විය යුතු ය. ☐
iv. සුලබ එකක් විය යුතු ය. ☐

**6. කලාකරුවකු අත්දැකීමක් ප්‍රකාශ කිරීමේ දී**

i. අදාළ හා උචිත දෑ පමණක් කිව යුතු ය. ☐
ii. ස්වකීය පරිකල්පනයෙන් එය විචිත්‍රවත් කළ යුතු ය. ☐
iii. එය ඉදිරිපත් කළ යුත්තේ අත්දැකීමෙන් ඈත් වී එය විග්‍රහ කරමිනි. ☐
iv. එය වාර්තාවක් විය යුතු ය. ☐

**03. පහත පදවල අර්ථ දක්වන්න.**

1. පරිකල්පනය - ..............................................................................................
2. විශ්වසනීයත්වය - ..............................................................................................
3. සහානුභූතිය - ..............................................................................................
4. සහෘදයා - ..............................................................................................
5. අන්තර්ඥානය - ..............................................................................................
6. පරිශීලනය - ..............................................................................................
7. ප්‍රේක්ෂකයා - ..............................................................................................
8. අනුභූතිය - ..............................................................................................
9. පාඨකයා - ..............................................................................................
10. ශ්‍රාවකයා - ..............................................................................................

**04. තමා විසින් කරන ලද නිර්මාණයන්ට පාදක වූ අත්දැකීම් කිහිපයක් පිළිබඳව ලේඛකයන් ඉදිරිපත් කළ අදහස් ඇසුරින් උපුටාගත් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. ඒවා හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

**1. ''ඒ නිර්මාණය සඳහා මා ජීවන තොරතුරු සොයා ගන්නේ මගේ අත්දැකීම් කුණුගොඩ හැරීමෙන්''**

i. මේ ප්‍රකාශය කළ ලේඛකයා කවරෙක් ද? ...........................................................
ii. මෙහි සඳහන් ඒ නිර්මාණය යනු කුමක් ද? ...........................................................
iii. එකී නිර්මාණයේ දී ''අල්ලිස්'' ප්‍රතිනිර්මාණය වූයේ කවරකු ලෙසට ද?
..............................................................................................
iv. ඔහුගේ වෘත්තිය කුමක් ද? ...........................................................

v. අල්ලිස් ගේ එම වෘත්තියට සම්බන්ධ වූ නගර දෙක කුමක් ද?

.......................................................................................................

vi. මේ ප්‍රකාශය කළ ලේඛකයා කවරෙක් ද? ..........................................................

vii. ලේඛකයා ස්වකීය අත්දැකීම ප්‍රතිනිර්මාණයේ දී ගල්කිස්ස දී දුටු මහලු ගවයාට තැබූ නම සොයා ලියන්න. ..........................................................................

viii. ''පිං ගොනා'' ලෙස ගැමියන් හැඳින්වූයේ කවර ගවයින් ද?

.......................................................................................................

ix. මෙහි සඳහන් ගැමියන්ගේ යහ සිරිතක් දක්වන්න.

.......................................................................................................

x. ලේඛකයාගේ මේ ප්‍රකාශයෙන් හැඟවෙන්නේ කුමක් ද?

.......................................................................................................

**2. ''ඒ කතාවේ තියෙන්නේ පට්ටපල් බොරුවක්. මම කවදාවත් වෙසක් කූඩුවක් හදලා නැහැ. හැදූ බවක් මට නම් මතක නෑ.''**

i. මෙහි මම යනුවෙන් හැඳින්වෙන තැනැත්තා කවුරුන් ද? ......................................

ii. ඔහු මේ කියන්නේ කුමන නිර්මාණයක් සඳහා තේමා කර ගත් අත්දැකීම පිළිබඳව ද?

.......................................................................................................

iii. එම නිර්මාණය සොයාගෙන කියවා එහි දක්වෙන අයියාට සිදු වූ දේ ලියන්න.

.......................................................................................................

iv. අයියාට එසේ වීමට මුල් වූ හේතුව ලියන්න.

.......................................................................................................

v. අත්දැකීමක් ප්‍රතිනිර්මාණය පිළිබඳ උක්ත ප්‍රකාශයෙන් ඔබට හැඟෙන දේ ලියන්න.

.......................................................................................................

vi. මේ නිර්මාණකරුවා දක්වන අත්දැකීම් වර්ග දෙක පාඩමෙන් සොයා ලියන්න.

.......................................................................................................

vii. හොඳ නිර්මාණයක් කිරීමට ඔහු කරන යෝජනාව කවරේ ද?

.......................................................................................................

**3. ''සිද්ධාර්ථ කුමාරයා මහබිනික්මන් කරලා තවුස් දම් පුරන කාලයේ තමන්ගේ ගෙදර දොර ජීවිතය ගැනත් මකක් වෙනවා.''**

i. මෙම ප්‍රකාශය කළ නිර්මාණකරුවා කවරෙක් ද? ..............................................

ii. ඔහු මෙම ප්‍රකාශය කරන්නේ කවර නිර්මාණයකට පාදක වූ අත්දැකීම ගැන ප්‍රකාශ කරන විටක දී ද? ..................................................................................

iii. ඔහු දක්වන පරිදි අත්දැකීම් ලබා ගත හැකි ක්‍රමවේදයක් දක්වන්න.

.......................................................................................................

iv. ''රාජතිලක'' යන චරිතය අන්තර්ගත ඔහු ලියූ කෘතිය කුමක් ද?

..........................................................................................................................

v. කතුවරයා රාජසිංහ රජු සම්බන්ධ පුවතක් රාජතිලකගේ චරිතය හා යොදා ගනියි. එය කුමක් ද? ..........................................................................................

vi. එම රාජතිලක මිය යන්නේ කවර රෝගයකින් ද?

..........................................................................................................................

vii. ''හඳ සහ නිව්යෝර්ක් නුවර'' කවි පන්තියට අත්දැකීම වූයේ කුමක් දැයි පාඩමෙන් සොයන්න. ..............................................................................................

**05. පහත දැක්වෙන ප්‍රකාශ ලේඛන ව්‍යවහාරයට හරවා ලියන්න.**

1. කෙටිකතාවලට වස්තු සොයන්නට සිතට වද දෙන ඒ කාලයේ දවසක මා හවස් වරුවේ ගෙදර බලා ගමන් කළා.

..........................................................................................................................

..........................................................................................................................

2. දරුවාගේ පවුලේ තත්ත්වය, දෙමවුපියන්ට ඇති ආදරය, ගෞරවය විතරක් නො වෙයි ආත්මානුකම්පාව වැනි දේ කීමත් මගේ අරමුණක් වුණා.

..........................................................................................................................

..........................................................................................................................

3. මෙහෙම කාමරයට හිරවෙලා තනිකම දරා ගන්න බැරි තැන ඔහු එළියෙ තියෙන කටුක සීතල ආවත් කමක් නෑ කියලා ජනේලයක් අරිනවා.

..........................................................................................................................

..........................................................................................................................

4. මට එක් අවස්ථාවක දී යන්ට පුළුවන්කම ලැබුණා යම් කිසි කටයුත්තකට ඇමරිකාවේ එක්සත් ජාතීන්ගේ මූලස්ථානයට.

..........................................................................................................................

..........................................................................................................................

5. පුංචි කාලේ මගේ වැඩිමල් සහෝදරයා වෙසක් කූඩුවක් තනනවා මම බලාගෙන හිටියා.

..........................................................................................................................

..........................................................................................................................

## ඒකකය - (24)
## අත්දැකීම් ප්‍රතිනිර්මාණය

### පිළිතුරු පත්‍රය

**01.** 1. i. නිර්මාණය හා විචාරය
ii. නිර්මාණ පසුබිම
2. i. මහාචාර්ය විමල් දිසානායක
ii. මහාචාර්ය ඒ.වී. සුරවීර
3. මාර්ටින් වික්‍රමසිංහ සූරීන්
4. අල්ලිස් නම් කරත්තකාරයෙක්
5. ජී.බී. සේනානායක සූරීන්
6. මහගම සේකර සූරීන්
7. බෝඩිම, රාජතිලක ලයනල් හා ප්‍රියන්ත

**02.** 1. i. ✓ iii. ✓ v. ✓
ii. ✓ iv. ✓ vi. ✓

2. i. × ii. ✓ iii. ✓ iv. ×

3. i. × ii. ✓ iii. ×

4. i. × ii. ✓ iii. ✓

5. i. ✓ ii. × iii. ✓ iv. ×

6. i. ✓
ii. ✓
iii. ×
iv. ×

**03.** 1. සිතින් මවා ගැනීම
2. විශ්වාසවන්ත බව/යථාර්ථවාදී බව
3. අනුභූතිය ඒ ආකාරයෙන්ම ජනිත වීම
4. සමාන හෘදයක් ඇත්තා
5. අවබෝධය, තර්ක ඥානය ඉක්මවා ගිය ශක්තිය
6. පාවිච්චි කිරීම/ඇසුරු කිරීම
7. බලා රසවිඳින්නා
8. අත්දැකීම/වස්තු බීජය/තේමාව
9. කියවා රස විඳින්නන්/පොත් පත් කියවන්නා
10. නිර්මාණ ශ්‍රවණය කර රස විඳින්නා/ශ්‍රවණය කරන්නා

**04.** 1. i. මාර්ටින් වික්‍රමසිංහ මහතා
ii. වහල්ලු කෙටිකතාව
iii. උපාලිස් නම් ගැමි කරත්තකරුවකු ලෙසින්
iv. තිරික්කලයෙන් මගීන් ප්‍රවාහනය
v. ගාල්ලේ කඩවත - කොග්ගල කතළුව
vi. තිරික්කලයෙන් වැටී කොන්ද කැඩීම
vii. හඳයා (කෙටිකතාව කියවන්න)
viii. වැඩ ගෙන මහලු වූ ගවයින්
ix. වැඩ ගත් ගවයා මස් කඩයට නො විකිණීම
x. තෝරා ගත් අත්දැකීමක් නිර්මාණයක් ලෙස ප්‍රතිනිර්මාණය කරන ආකාරය පිළිබඳවය

2. i. ජී.බී. සේනානායක මහතා
ii. වෙසක් පහන කෙටිකතාව
iii. ගිනි ගත් කුඩුව නිවන්නට ගොස් පිච්චීම
iv. මල්ලීගේ අපරීක්ෂාකාරී කුඩු පත්තු කිරීම
v. නිර්මාණයක අත්දැකීම මනඃකල්පිත එකක් විය හැකි බවත් ප්‍රතිභාව තුළ එය විශ්වසනීය එකක් ලෙස පාඨකයා වෙත ඉදිරිපත් කළ හැකි බවත් ය.
vi. පුද්ගල අත්දැකීම් හෙවත් ලේඛන අත්දැකීම් හා සමාජ අත්දැකීම්
vii. හැකි තරම් පොත් කියවා දැනුම ලබා ගත යුතු බව

3. i. මහගම සේකර මහතා
   ii. මාර යුද්ධය කවි පන්තිය
   iii. තමා විසින් හෝ ආශ්‍රය කරන පුද්ගලයන් මගින්, පොත්පත් කියවීමෙන්, චිත්‍රපටි බැලීමෙන්
   iv. රාජතිලක ලයනල් සහ ප්‍රියන්ත
   v. රාජසිංහ රජු කුළු මී හරකෙකුගේ අං දෙකෙන් අල්ලා මෙල්ල කිරීම
   vi. අංශබාග නම් රෝගය
   vii. එක් අවස්ථාවක ඇමරිකාවේ එක්සත් ජාතීන්ගේ මූලස්ථානයට ගොස් එහිදී ඇති වූ පාළු ගතිය මූලික කර ගෙන ය.

**05.** ලිඛිත ව්‍යවහාරය යොදා ගෙන උක්තාඛ්‍යාත ගැළපෙන සේ සකසා තිබීම අවශ්‍ය ය.

උදා:- (1). මම ............ ගමන් කළෙමි.

(2). මගේ ............ අරමුණ විය.